# PRIME ENTRY BOOKS

# (Part-X)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# වැරදි නිවැරදි කිරීම

ගනුදෙනු වාර්තා කිරීමේ දී විවිධ හේතු නිසා වැරදි සිදු වේ.

ගනුදෙනු වාර්තා කරන විවිධ අවස්ථාවල දී වැරදි සිදුවිය හැකිය.

ඕනෑ ම ගනුදෙනුවකට නිවැරදි ද්විත්ව සටහනක් පවතින අතර, නිවැරදිව සටහන් තැබීමෙන් පිළියෙල කරන **ශේෂ පිරික්සුම තුලනය** වේ.

# වැරදි වර්ග කිරීම

ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදු වන වැරදි ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකට වර්ග කළ හැකි වේ.

- ශේෂ පිරික්සුමේ අනාවරණ නොවන (සමානතාවට බලනොපාන) වැරදි
- ශේෂ පිරික්සුමේ අනාවරණය වන (සමානතාවට බලපාන) වැරදි

ClassWork.LK

ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි සිදුවන අවස්ථාවක දී ශේෂ පිරික්සුම තුලනය වේ.

කුමන ආකාරයෙන් හෝ සිදුවන වැරදි නිවැරදි කිරීමට **පොදු ජර්නලය** තුළ සටහනක් තැබිය යුතුය.

ClassWork.LK

## **ශේෂ පිරික්සුමෙන් අනාවරණය නොවන වැරදි**

- කිසියම් ගනුදෙනුවකට අදාළ මූලාශ්‍ර ලේඛනය සටහන් කිරීම අත්හැරීම

- ප්‍රධාන ගිණුම්කරණ මූලධර්මවලට පටහැනිව ගනුදෙනු වාර්තා කිරීම

- යම් ගනුදෙනුවක වටිනාකම ගිණුම්වල වැඩියෙන් හෝ අඩුවෙන් සටහන් වීම

- යම් ගනුදෙනුවක් වාර්තා කිරීමේ දී සිදු වූ වරදක් තවත් වරදක් මගින් හිලව් වීම

- ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන ගිණුම්වල දෙවරක් සටහන් වීම

ශේෂ පිරික්සුමේ අනාවරණය නොවන **(සමානතාවට බලනොපාන)** වැරදි හඳුනා ගෙන, ඒ ඒ වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය සටහන් පොදු ජර්නලය තුළ තබා ඒවා ලෙජරයට පිටපත් කළ යුතු ය.

ClassWork.LK

# ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි

- ගනුදෙනුවක වටිනාකම ගිණුම් දෙකේම අගයයන් දෙකකින් සටහන් වීම

- ගනුදෙනුවක ද්විත්ව සටහනින් එක් සටහනක් මග හැරීම

- ලෙජර් ගිණුම් තුලනය කිරීමේ දී සිදුවන වැරදි

- ගනුදෙනුවක ද්විත්ව සටහන ගිණුම් දෙකේම එකම පැත්තේ සටහන් වීම

# අවිනිශ්චිත ගිණුම

ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන (සමානතාවට බලපාන) වැරදි හේතුවෙන් ශේෂ පිරික්සුම තුලනය නොවන නිසා ''ඇතිවන වෙනස '' ලෙජරයේ අවිනිශ්චිත ගිණුමකට තාවකාලිකව මාරු කරනු ලැබේ.

වැරදි නිවැරදි කළ පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය අහෝසි වී යයි.

ClassWork.LK

# <u>ලාභ සංශෝධිත ලේඛනය</u>

ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවන වැරදි නිසා ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රතිඵලයට බලපෑමක් වන අතර, වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි මූල්‍ය ප්‍රතිඵලය ගණනය කළ හැකි ය.

නිවැරදි මුල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමට **ලාභ සංශෝධිත ලේඛනයක්** පිළියෙල කරයි.

සිදු වී ඇති වැරදි තුළ ආදායම් හා වියදම්වලට බලපාන ගනුදෙනු පමණක් තෝරා ගනිමින් ලාභ සංශෝධන ලේඛනය පිළියෙල කරයි.

ClassWork.LK

**<u>අභ්‍යාස</u>**

(01) පහත වැරදි අතරින් ශේෂ පිරික්සුමේ සමානතාවයට බලනොපාන වැරදි තෝරන්න.

මුදල් ලැබීම් ජර්නලයේ අත්පිට විකුණුම් තීරුවේ එකතුව රු. 15000 ක් විකුණුම් ගිණුමේ රු. 1 500 ක් ලෙසත් සටහන් කිරීම.

අත්පිට ගැනුම් රු. 12 000 ක් මුදල් ගෙවීම් ජර්නලයේ රු. 1 200 ක් ලෙස සටහන් කිරීම.

අමල්ගෙන් ලද රු. 8 000 ක් මුදල් පාලන ගිණුමේ හා අමල්ගේ ගිණුමේ හර පැත්තේ සටහන් කිරීම.

ණයහිමි නිෂාදිට ආපසු යැවුම් රු. 1 400 ක් ආපසු යැවුම් ජර්නලය තුළ රු. 1 400 ක් ලෙසත් නිශාදිගේ ගිණුමේ රු. 140 ක් ලෙසත් හර කිරීම.

මුදල් ලැබීම් ජර්නලයේ ණයගැති එකතු තීරුවේ වටිනාකම රු. 60 000 ක් මුදල් පාලන ගිණුමේ වාර්තා නොවීම.

ClassWork.LK

(02) ශුද්ධ ලාභයට බලපෑමක් ඇති නොකරන වැරැද්ද තෝරන්න.

මුදල් ලැබීම් ජර්නලයේ දුන් වට්ටම් තීරුව රු. 2 000 ක් අඩුවෙන් ගෙන තිබීම.

(අත්පිට විකුණුම් රු. 35 000 ක් මුදල් ලැබීම් ජර්නලයේ හා විකුණුම් ගිණුමේ රු. 53 000ක් ලෙස සටහන් කිරීම.

ලෙජරයේ ගැණුම් ගිණුම තුලනය කිරීමේ දී රු. 6 000 ක් වැඩියෙන් ගෙන තිබීම.

ගමන් වියදම් වශයෙන් ගෙවූ රු. 4 00 ක් ලිපි ද්‍රව්‍ය වියදම් ගිණුමට රු. 4 000 ක් ලෙස හර කිරීම.

ගැනිලි ගිණුමේ රු. 1 500 ක් ශේෂය ශේෂ පිරික්සුමට ගෙන ගොස් නැත.

ClassWork.LK

(03) පහත ප්‍රකාශ සත්‍ය නම් √ ලකුණ ද අසත්‍ය × නම් ලකුණ ද යෙදීම.

ගනුදෙනුවක් නිවැරදි වටිනාකමට වඩා වැඩියෙන් මූලික පොතක සටහන් කළ විට එය ශේෂ පිරික්සුම තුලනය වීමට බලනොපායි. (      )

අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි පොත්වල වාර්තා නොවීම ලාභයට බල නොපායි. (      )

ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කර වැරදි නිවැරදි කිරීමෙන් පසුව අවිනිශ්චිත ගිණුම අහෝසි වී යයි. (      )

අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් ඇතිවීමට තුඩු දෙන දෝෂ ලාභයට බලපෑමක් ඇති නොකරයි. (      )

ශුද්ධ ලාභය නිවැරදි කිරීමට අදාළ වන්නේ දෝෂ තුළ ඇතුළත් ආදායම් හා වියදම් වෙනස්වීම් පමණි.(      )

ClassWork.LK

(07) පහත සඳහන් වන්නේ මුදිත ගේ ව්‍යාපාරයේ 2021/03/31 න් අවසන් වසරේ ගිණුම් තැබීමේ දී සිදු වූ දෝෂ වේ.

රු. 30 000 ක අශාන්ට ණයට විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් මඟ හැරීම

රු. 12 000 ක ගොඩනැගිලි අලුත්වැඩියාවක් ගොඩනැගිලි ගිණුමට හර කිරීම.

රු. 2 000 ක විදුලිය වියදම දෙවරක් මූලික පොත්වල සටහන් වීම.

රු. 18 000 කට පසිඳුගෙන් ණයට ගත් බඩු තොගය, ගැනුම් ජර්නලයේ රු. 8 100 ක් ලෙස සටහන් කිරීම.

රු. 4000 ක අත්පිට විකුණුම්, මුදල් ලැබීම් ජර්නලයේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමට පිටපත් කර නැති අතර, රු. 24 000 ක් රවිඳුට ගෙවීම මුදල් ගෙවීම් ජර්නලයේ නිවැරදිව වාර්තා කර, රවිඳුගේ ගිණුමේ රු. 20 000 ක් ලෙස හර කිරීම.

ClassWork.LK

අවශ්‍ය වන්නේ :

1) ඉහත එක් එක් දෝෂය නිවැරදි කිරීමේ ජර්නල් සටහන දැක්වීම.

2) මුදිතගේ ව්‍යාපාරයේ 2017/03/31 න් අවසන් වසරේ කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 128 000 ක් නම්, ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ලේඛනයක් පිළියෙල කිරීම.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura